**ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**

ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුලි 13 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 897.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 847.07 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසන ලද ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 22.93 ක් හෙවත් සියයට 3 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 574.00 | 569.28 | 4.72 | 01 |
| මූලධන | 323.00 | 304.79 | 18.21 | 06 |
| එකතුව | 897.00 | 874.07 | 22.93 | 03 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 12 ක් හා දෙපාර්තමේන්තු 07 ක් විසින් එකතුව රු. මිලියන 54.87 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. එම ප්‍රතිපාදනවලින් පිළිවෙලින් රු.මිලියන 28.15 ක් හා රු.මිලියන 25.46 ක් වශයෙන් රු.මිලියන 53.61 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1.25 කින් සමන්විත රු.මිලියන 1.00 ක් හා රු. මිලියන 0.25 ක් පිළිවෙලින් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසන ලද ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 3 කින් හා සියයට 1 කින් නියෝජනය විය.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 35.50 | 35.47 | 20.00 | 30.29 | 120.00 | 101.90 |

## 2.3 අග්‍රිම ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 7002/0000/00/0287/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 607,576 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක පොදු තැන්පත් ගිණුම්වල 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. 136,076,632 ක් විය. විස්තර පහත දැක්වේ.

| **ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. |
| 6003/0000/00/0015/0000/000 | 563,838 |
| 6000/0000/00/0001/0074/000 | 5,392,779 |
| 6000/0000/00/0002/0098/000 | 103,800 |

| | |
|---|---|
| 6000/0000/00/0013/0066/000 | 41,117,327 |
| 6000/0000/00/0014/0010/000 | 893,950 |
| 6000/0000/00/0016/0049/000 | 87,611,477 |
| 6000/0000/00/0017/0017/000 | 247,079 |
| 6000/0000/00/0018/0058/000 | 146,382 |
| | ------------- |
| එකතුව | 136,076,632 |
| | ======== |

**2.4 විගණන නිරීක්ෂණය**

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත් කාලීන කර නොතිබුණි. |
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) | යාවත් කාලීන කර නොතිබුණි. |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සහ මූලධන වැය විෂයක් සඳහා සලසන ලද ප්‍රතිපාදන එකතුව රු. 66,900,000 ක් වූ අතර ඉන් රු. 11,768,394 ක් ඉතිරි වී තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 14 ක් සහ එක් මූලධන වැය විෂයයක් සඳහා සලසන ලද රු.254,400,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක් නියෝජනය වන රු.30,788,000 ක මුදලක්, මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයන්වලට මාරු කර තිබුණි.

**3.3 අග්‍රිම ගිණුම**

**-------------**

මුදල් රෙගුලාසි 373 ප්‍රකාරව, දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට ප්‍රතිපූර්ණය කළ යුතු 2016 දෙසැම්බර් 31 දිනට අදාළ අග්‍රිම ශේෂය වන රු.607,576 ක් 2017 අගෝස්තු 15 දින වනවිටත් ප්‍රතිපූරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන අනුව, 1983 වර්ෂයේ සිට රු.563,837 ක මුදලක් පොදු තැන්පත් ගිණුම්වල දිගින් දිගටම පෙන්වමින් පැවතුණි. කෙසේ වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලබන ලේඛන අනුව එවැනි ශේෂයක් පෙන්නුම් නොකෙරුණි. මෙම ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පොදු තැන්පත් ගිණුම් සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණු ගිණුම් අංක භාවිතා කිරීම පිළිබඳව එතරම් සැලකිල්ලක් දක්වා නොතිබුණි. ඒ වෙනුවට, අදාළ නොවූ ගිණුම් අංක භාවිතා කර තිබුණි.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

**----------------------------------------**

**3.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**-------------------------------**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව යාවත්කාලීන කරනු ලැබූ සංවිධාන සටහන, අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය, අග්‍රිම අවශ්‍යතාවයන් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක, දැක්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම වැනි විස්තර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් විය යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ ඉහතින් දක්වා තිබුණු කරුණු ඇතුළත්ව නොතිබුණි.

**3.5.2 වත්කම් කළමනාකරණය**

**---------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් කළමනාකරණයට අදාළව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලදී.

**(අ) නිෂ්කාර්ය වත්කම්**

**---------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සම්පත් මධ්‍යස්ථානයක් ඇතිකිරීමේ අරමුණින් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2014 සැප්තැම්බර් 12 දින රු.490,000 ක් වටිනා පරිගණක 05 ක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. මෙම පරිගණක ලබා දී තිබුණු දින සිට නිෂ්ක්‍රීයව පැවැති අතර මේ වන විට ඒ සඳහා වන වගකීම් කාලයද ඉකුත්ව ගොස් තිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන්ට ලබා දී ඇති වත්කම්**

මඩකලපුව, ග්‍රීන් මාවතෙහි පිහිටි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස 02 ක බාහිර පුද්ගලයන් 2008 වර්ෂයේ සිට පදිංචිව තිබුණි. කෙසේ වුවද, එම නිල නිවාස ආපසු ලබා ගැනීමටත් එමගින් නිල නිවාස අයදුම්කර ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන්ට ඒවා ලබාදීමටත් කටයුතු කර නොතිබුණි.

**(ඇ) නිරවුල් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ලක් වෙනුවෙන් 2006 සිට 2013 වර්ෂය දක්වා මඩකලපුව මහ නගර සභාවට ගෙවිය යුතු රු.190,668 ක වරිපනම් බදු මේ දක්වා නිරවුල් කර නොතිබුණි.

## 3.6 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවල යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 103 හා 104 | 898,092 | 2011, 2012 හා 2014 වර්ෂවලදී පෝරතිවු පත්තු හා ඒරාවුර් පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් වාහන 03 ක් අනතුරුවලට භාජනය වී තිබූ අතර රු.898,092 ක පාඩුවක් සිදුකර තිබුණි. වගකිව යුතු පුද්ගලයන් හා අලාභය නිර්ණය කිරීම සඳහා විමර්ශන කමිටුවක් පත්කර තිබුණත්, අදාළ වාර්තා මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 215 (3) | - | කිසියම් නිශ්චිත වූ කාර්යයක් සඳහා නිශ්චිත වූ වර්ෂයක කරන ලද ප්‍රතිපාදනවලින් ආපසු ගැනීම් නොකළ යුතු අතර ඒවා අනාගතයේදී ඇතිවිය හැකි ගෙවීම් සඳහා තැන්පත් ගිණුමක තැන්පත් කර තිබිය යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී සිදුකිරීමට නියමිත විෂ මත්ද්‍රව්‍ය |

| | | | |
|---|---|---|---|
| | | | භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා ප්‍රතිපාදිත මුදලින් ඉදිරි වර්ෂයේදී පැවැත්වීමට නියමිත මෙම වැඩසටහනට අදාළ සම්මන්ත්‍රණවලට උපයෝජනය කිරීම සඳහා රු.350,958 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වෙනත් බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි. |
| (ආ) | 2009 දෙසැම්බර් 22 දිනැති අංක එච්ජීඑන්/4/2/1 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක ග්‍රාම නිලධාරීන් 35 දෙනෙකුගෙන්, රියැදුරන් 36 දෙනෙකුගෙන් හා රජයේ නිලධාරීන් 81 දෙනෙකුගෙන් ඇප තැන්පතු ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) | 2015 ජුලි 07 දිනැති අංක බීඩී/ජීපීඑස්/130/9/14/එම්සී-II දරන ජාතික අයවැය අධ්‍යක්ෂවරයාගේ ලිපිය | 1,202,920 | ස්ථාන මාරු වී ගිය/ සේවය අතහැර ගිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරීන් 09 දෙනෙකුට නිකුත් කළ රු.1,202,920 ක් වටිනා යතුරු පැදි 09 ක වටිනාකම අයකර ගෙන නොතිබුණි. |

## 3.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දූර්වලතා

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාළව සිදු කරන ලද විගණන පරීක්ෂණවලට අනුව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.7.1 පාරවල් සහ බෝක්කු ප්‍රතිසංස්කරණය

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ වැඩසටහනක් යටතේ මන්මුනෙයි බටහිර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය ඇතුළත පාරවල් 09 ක් සහ බෝක්කු 03 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.13,039,503 ක් වැයකර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභාවේ චක්‍රලේඛය ප්‍රකාරව පළාත් සභා සහ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල පාරවල් ඉදිකිරීමේදී ඒවා කාපට් කිරීම, තාර දැමීම හා කොන්ක්‍රීට් දැමීම සිදුකළ යුතු අතර පාරවල්වලට බොරළු ඇතිරීම වැනි තාවකාලික පිළියම් සිදුනොකළ යුතු බවත් දක්වා තිබුණි. කෙසේ වුවද, චක්‍රලේඛය උල්ලංඝනය කරමින් ඉහතින් සඳහන් පාරවල් දෙකක් සඳහා බොරළු අතුරා තිබුණි.

(ආ) පාරවල් 04 ක් සහ බෝක්කු 03 ක් සඳහා ඝන මීටර 1,302 ක බොරළු භාවිතා කර ඇති බව තාක්ෂණික නිලධාරී විසින් ලිඛිතව සනාථ කර තිබුණි. එසේ වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බොරළු ඝන මීටර් 1,470 ක් සඳහා ගෙවීම් කර තිබුණි. මේ හේතුවෙන් රු.123,669 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට වැඩියෙන් ගෙවා තිබුණි.

(ඇ) නරිපුල් තෝට්ටම්, කසුපදි පාර කොන්ක්‍රීට් කිරීමේදී ඝන මීටර් 27 ක පස් භාවිතා කර තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පස් ඝන මීටර් 32.6 ක් සඳහා ගෙවීම් කර තිබුණි. මේ හේතුවෙන් රු.12,465 ක් කොන්ත්‍රාත්කරුවන්ට වැඩියෙන් ගෙවා තිබුණි.

(ඈ) ආයිත්තමලෙයි උතුර කට්පූදනෙයි පාර (Aayithdhamalai North, Katpoothanai road) සහ කරවෙට්ටි පනග්කට්ටිචෝලයි පාර (Karavetti Panagkattichcholai Road) සඳහා ඇස්තමේන්තුගත බොරළු ප්‍රමාණය පිළිවෙලින් මිලිමීටර් 450 ක් සහ මිලිමීටර් 600 කි. කෙසේ වුවත්, මිලිමීටර් 300 ක උසකට පමණක් බොරළු භාවිතා කර තිබුණි. මේ හේතුකොටගෙන වැසි සමයේදී පාර සඳහා යොදාගෙන ඇති බොරළු සේදීගෙන යා හැකිය.

### 3.7.2 දිවිනැඟුම වැඩසටහන යටතේ එළදෙනුන් ලබාදීම

---------------------------------------------------------

දිවිනැඟුම ජාතික වැඩසටහන යටතේ සමෘද්ධිලාභීන්ට ලබාදීම සඳහා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් මන්මුනෙයිපත්තු දකුණ එරුවිල්පත්තු ප්‍රා දේශීය ලේකම් කාර්යාලයට 2014 වර්ෂයේදී රු.4,500,000 ක මුදලක් ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලට අනුව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් පශු ශල්‍ය වෛද්‍යවරයා විසින් ඔහුගේ 2014 සැප්තැම්බර් 02 දිනැති අංක ඩීවීඑස්/පීසීඕ/දිවිනැඟුම/2014 දරන ලිපිය මඟින් එළදෙනුන් ලබාගත හැකි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනයක් නිර්දේශ කර තිබුණි. එලෙස නිර්දේශ නොකරන ලද සැපයුම්කරුවෙකුගෙන් එළදෙනුන් 75 දෙනෙකු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණි.

(ආ) 2012 ජුලි 10 දිනැති අංක 02/2012 දරන දිවිනැඟුම චක්‍රලේඛය ප්‍රකාරව, ගව අභිජනන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන්ට ආධාර වශයෙන් ලබාදිය හැකි උපරිම මුදල එළදෙනුන් දෙදෙනෙකු සඳහා රු.60,000 කි. තවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලැබුණු මිල ගණන් අනුව, කිලෝ ග්‍රෑමයක් රු. 180 බැඟින් වන ගාස්තුවකට එළදෙනුන් දෙදෙනෙකු දිය හැකිව තිබුණි. කෙසේ වුවද, ප්‍රතිලාභියෙකුට එක් එළදෙනෙකු බැඟින් පමණක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබා දී තිබුණි. මේ අනුව, එළදෙනුන් 150 ක් වෙනුවට එළදෙනුන් 75 ක් පමණක් ලබා දී තිබුණි.

(ඇ) පශු ශල්‍ය වෛද්‍යවරයාගේ සෞඛ්‍ය සහතිකයකින් තොරව එළදෙනුන් ප්‍රතිලාභීන්ට ලබාදී තිබුණි. ඒ අනුව ලබාදී තිබුණු සම්පූර්ණ එළදෙනුන් සංඛ්‍යාවෙන් එළදෙනුන් 07 කට අදාළ කාලය ඇතුළත දීම මියගොස් තිබුණු බව ප්‍රතිලාභීන්ගේ ලිඛිත ප්‍රකාශවලින් සනාථ විය.

### 3.7.3 ග්‍රාමීය ආර්ථික සංවර්ධන වැඩසටහන

---------------------------------------

මඩකලපුව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය සහ ග්‍රාමීය යටිතල පහසුකම් නඟා සිටුවීම සඳහා වන ග්‍රාමීය ආර්ථික සංවර්ධන වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන ලබා දී තිබුණි. මෙම මුදලින් රු.1,470,000 ක මුදලක් 2016 වර්ෂය තුළදී විෂ මත්ද්‍රව්‍ය භාවිතය පාලනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා ලබා දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 අගෝස්තු 01 දිනැති අංක MREA/5/9/1 දරන ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය ප්‍රකාරව මෙම අරමුදල් ග්‍රාමීය සංවර්ධනය සහ ග්‍රාමීය යටිතල පහසුකම්

සංවර්ධනය වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කළ යුතුය. කෙසේ වෙතත්, මෙය උල්ලංඝනය කරමින් විෂ මත්ද්‍රව්‍ය භාවිතා කිරීම පාලනය සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අරමුදල් උපයෝජනය කර තිබුණි.

(ආ) විෂ මත්ද්‍රව්‍ය භාවිතා කිරීම පාලනය සිසුන් හා තරුණ ජන කොටස් අතර දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා ඒප්‍රන් 1,500 ක් මෙම අරමුදලින් මිලදී ගැනීමට දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර තිබුණි. කෙසේ වුවද, ඒප්‍රන් 1,800 ක් රු.1,119,042 කට මිලදී ගෙන තිබුණි.

(ඇ) අදාළ වැඩසටහන පදනම් කරමින් 2016 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන තිබූ ඒප්‍රන් 1,800 සිසුන් හා තරුණ ජන කොටස් අතර බෙදා හැර නොතිබුණි. නිෂ්ඵල වියදමක් ලෙස මෙම ඒප්‍රන් තොගය ගබඩාවේ තබා තිබුණි.

## 3.8 අධිකාරී බලය නොමැති ගනුදෙනු

---------------------------------------

කෝරලෙයිපත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම්වරයා අනුමැතියකින් තොරව විදේශගතව තිබුණු අතර ඒ වෙනුවෙන් රු.607,576 ක මුදලක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. මෙම විදේශ සංචාරය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු අතර වෙනත් කාර්යයක් සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන මෙම සංචාරය සඳහා උපයෝජනය කර තිබුණි. කෙසේ වුවද, විදේශ සංචාරය සඳහා ගෙවීම් නිර්දේශ කළ නිලධාරියාට විරුද්ධව කිසිඳු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.9 වංචනික ස්වරූපයේ ගනුදෙනු

-----------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් වංචනික ස්වරූපයේ ගනුදෙනු අනාවරණය විය.

(අ) ග්‍රාමීය ආර්ථික සංවර්ධන කටයුතු අමාත්‍යාංශය සහ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය විසින් මහන මැෂින් 35 ක්, අදාළ උපකරණ සහ කුඩා ඇඟළුම් කර්මාන්ත ගුරුවරියන් දෙදෙනෙකුට සහ අභ්‍යාසලාභීන් සඳහා වන මැහුම් මධ්‍යස්ථාන වියදම් වෙනුවෙන් රු.4,829,896 ක මුදලක් 2016 වර්ෂයේදී කෝරලෙයිපත්තු බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මැහුම් මධ්‍යස්ථාන සඳහා මැහුම් උපදේශකවරුන් 2017 ජනවාරි අවසාන වන විටත් පත්කර ගෙන නොතිබුණි. කෙසේ වෙතත්, උපදේශකවරුන් බඳවාගෙන ඇති බවත් පුහුණු වැඩසටහන් පවත්වාගෙන යනු ලබන බවත් පවසමින් වගකිව යුතු නිලධාරියෙකුගේ නිර්දේශය මත රු.618,750 ක් වංචා සහගත ලෙස 2016 දෙසැම්බර් 30 දින වංචා සහගත ලෙස ගෙවීම් කර තිබුණි.

(ii) විගණන දිනය වන 2017 ජනවාරි 30 වන විටත් මැහුම් මධ්‍යස්ථානය සඳහා කිසිඳු අයිතමයක් මිලදී ගෙන නොතිබුණි. කෙසේ වෙතත්, චෙක්පත් 06 ක් මඟින් රු.2,490,524 ක් වටිනා භාණ්ඩ 21 ක් මිලදී ගෙන ඇති බවට වගකිව යුතු නිලධාරියෙකුගේ නිර්දේශ මත 2016 දෙසැම්බර් 30 දින වංචා සහගත ලෙස ගෙවීම් සිදු කර තිබුණි.

(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන යටතේ දුගී ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් ප්‍රතිලාභීන් පස්දෙනෙකු වෙත රු.114,000 ක මුදලක් ඉතිරිකිරීමේ ගිණුම්වල කෝරලෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තැන්පත් කර තිබුණි. මෙම මුදල් වංචනික ලෙස බැංකු සේවකයින් විසින් ආපසු ලබාගෙන ඇති බවට ප්‍රජා මූල බැංකු කළමනාකරුගේ හා නිලධාරීන්ගේ ප්‍රකාශ මඟින් තහවුරු කර තිබුණි. කෙසේ වුවද, අදාළ සේවකයින්ට විරුද්ධව මේ දක්වා කිසිඳු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) ග්‍රාමීය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය විසින් සලසා තිබුණු ප්‍රතිපාදන යටතේ මැහුම් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන 02 ක් ස්ථාපිත කිරීමේ අරමුණින් කලුවංචිකුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.575,978 ක් වටිනා මහන මැෂින් 26 ක් සහ උපකරණ මිලදී ගෙන තිබුණි. මෙම පුහුණු මධ්‍යස්ථාන 02 ස්ථාපිත කර එම උපකරණ ඒවාට සැපයීම වෙනුවට, 2016 දෙසැම්බර් 23 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් තෝරාගනු ලැබූ ග්‍රාමීය සංවර්ධන සමිතීන් දෙකක් වෙත මෙම අයිතමයන් ලබාදී තිබුණි. 2017 මාර්තු 03 දින වන විටත් අවශ්‍ය සේවක පිරිස් සමඟ ඉහත සඳහන් මැහුම් පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කර නොතිබුණු නමුත් උපදේශකවරුන් සහ මුරකරුවන් එම මධ්‍යස්ථානවලට අනුයුක්ත කර ඇති බව සඳහන් කරමින් 2016 වර්ෂයේදී ඔවුන්ගේ වැටුප් සහ පරිපාලන වියදම් සඳහා රු.412,000 ක් ගෙවීම් කර තිබුණි.

(ඈ) මන්මුනෙයි දකුණ එරුවිල් පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ සිටින දුප්පත් ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීමේ අරමුණින් ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් එරුවිල් ග්‍රාමයේ එරුවිල් ජීවනෝපාය සංවර්ධන බැංකුව ස්ථාපිත කර 2014 සහ 2015 වර්ෂවලිදී සමෘද්ධිලාභීන්ට ණය ලබාදී තිබුණු අතර ණය වාරික සංවර්ධන නිලධාරීන් විසින් අයකරගෙන තිබුණි. මෙලෙස ප්‍රතිලාභීන් 16 දෙනෙකුගෙන් අයකරගත් රු.37,650 ක් අයුතු ලෙස පරිහරණය කර ඇති බවට ප්‍රතිලාභීන්ගේ සහ බැංකු කළමනාකරුගේ ලිඛිත ප්‍රකාශ මඟින් තහවුරු වී තිබුණි. කෙසේ වුවද, මේවාට සම්බන්ධිත අයට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(ඉ) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් මන්මුනෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ නැවත පදිංචි කළ ප්‍රතිලාභීන් 47 දෙනෙකු සඳහා නිවාස ඉදිකිරීමට රු.36,848,000 ක ප්‍රතිපාදන 2016 වර්ෂයේදී සලසා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක එම්ආර්/4/1 දරන 2016 අප්‍රේල් 24 දිනැති ලිපිය ප්‍රකාරව, අවසාන ගෙවීම් සිදුකළ යුත්තේ ඉදිකිරීමට අදාළ සියළුම වැඩ කොටස් සම්පූර්ණ කිරීමෙන් අනතුරුවය. වහළවල්, දොරවල් සහ ජනෙල් වැඩ අවසන් නොවූ එහෙත් සියළුම වැඩ සම්පූර්ණ කරන ලද බවට වූ වගකිව යුතු නිලධාරියෙකුගේ නිර්දේශය මත රු.9,118,000 ක මුදලක් 2016 දෙසැම්බර් 21 දින ප්‍රතිලාභීන් 47 දෙනෙකුගේ බැංකු ගිණුම් වෙත නිදහස් කර තිබුණි.

(ii) ඉහත සඳහන් අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය ප්‍රකාරව, අවසාන ගෙවීම් සිදුකිරීම් සඳහා දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මෙලෙස දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව සියළුම ප්‍රතිලාභීන්ටම අවසාන ගෙවීම් සිදුකර තිබුණි.

## 3.10 කළමනාකරණ දුර්වලතා

විගණන නියැදි පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතාවයන් අනාවරණය විය.

(අ) සිම් ශ්‍රී ලංකා (Sim Sri Lanka) නැමැති ස්වෙච්ඡා සංවිධානයක් කෝරලෙයිපත්තු බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයෙන් ඔබ්බට වූ ගමක ස්ථාපිත කර තිබුණි. සමාජ සේවා නිලධාරිගේ සහ ග්‍රාම නිලධාරීවරුන්ගේ ලිඛිත ප්‍රකාශ මඟින් අදාල සංවිධානය කිසිඳු සමාජ සේවා කටයුත්තක නියැලි නොමැති බව තහවුරු කර තිබුණි. එසේ වුවද, කෝරලෙයි පත්තු බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.300,000 ක් වටිනා ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍ර දෙකක්, ලැප්ටොප් පරිගණකයක් සහ ඩිජිටල් කැමරාවක් 2014 වර්ෂයේදී ස්වෙච්ඡා සංවිධානයට ලබා දී තිබුණි. එසේ වුවද, එම ස්ථානයේ සිදුකළ භෞතික පරීක්ෂාවේදී එම අයිතමයන් එහි නොවූ බව අනාවරණය විය. තවද, 2016 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු.300,000 ක් වටිනා පරිගණක, ලැප්ටොප් පරිගණක සහ මුද්‍රණ යන්ත්‍රණයක් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අදාළ ස්වෙච්ඡා සංවිධානයට ලබා දී තිබුණි. කෙසේ වුවද, දිගින් දිගමට මෙම ස්වෙච්ඡා සංවිධානයට අයිතමයන් ලබාදීම නිර්දේශ කළ නිලධාරියාට එරෙහිව විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්වරයා විසින් නිකුත් කර ඇති HA/DA/12/27 දරන 2006 මාර්තු 26 දිනැති ලිපිය ප්‍රකාරව සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් ඔවුන්ට වෙන්කරනු ලැබ ඇති නිල නිවාසවල පදිංචි වී සිටිය යුතු බව දැක්වේ. එසේ වුවත්, මන්මුනෙයිපත්තු ප්‍රාදේශීය ලේකම්වරයා ඔහුගේ නිල නිවසේ පදිංචි වී නොමැති අතර එම නිල නිවාස, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි ප්‍රධාන කාර්යාලය වශයෙන් 2015 නොවැම්බර් මාසයේ සිට කටයුතු පවත්වාගෙන යයි. නිල නිවාස අදාළ අරමුණු සඳහා යොදා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

## 3.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 49 | 48 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 44 | 11 | 33 |
| (iii) | ද්විතීයික මට්ටම | 927 | 802 | 125 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 146 | 128 | 18 |
| (v) | වෙනත් (අනියම්) | - | 08 | - |
| | **එකතුව** | **1,166** | **997** | **177** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ග්‍රාම නිලධාරී තනතුරු 100 ක් පිරවීමට කටයුතු නොකිරීම හේතුකොට ගෙන ගම්වැසියන් මහත් දුෂ්කරතාවයන්ට මුහුණපාමින් සිටිති.

(ආ) පරිපාලන නිලධාරී තනතුරු 06 ක් සඳහා ස්ථිර නිලධාරීන් පත්කර නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන කටයුතු දුර්වල මට්ටමක පැවතුණි.

(ඇ) 2016 ජුනි 29 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා චක්‍රලේඛය ප්‍රකාරව සේවා ස්ථානයක වර්ෂ 05 කට වැඩි කාලයක් සේවය කළ සියළුම නිලධාරීන් 2016 දෙසැම්බර් 31 දින වන විට ස්ථාන මාරු කිරීමට කටයුතු සළසා තිබිය යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 ක වර්ෂ 05 කට අධික කාලයක් සේවය කළ කළමනාකාර සහකාරවරුන් 58 දෙනෙකු ස්ථාන මාරුකිරීමට කටයුතු කර නොතිබුණි.